## ශිෂ්‍ය චර්යාධර්ම සංග්‍රහය

## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

**09.08.2024 දින අනුමත කරන ලදී**

විශ්වවිද්‍යාලය ප්‍රජාවක් ලෙස සලකනු ලබන අතර එම ප්‍රජාවේ සාමාජිකයන් වන, එහි සිසුන් සෑම විට අන් අයට එනම්, අනෙකුත් සිසුන්, කාර්ය මණ්ඩල සාමාජිකයින්, විශ්වවිද්‍යාලයට පැමිණෙන අමුත්තන් හෝ ප්‍රාදේශීය ප්‍රජාවේ සාමාජිකයන්, යනාදීන් වෙත වගකිව යුතු සහ ගෞරවනීය ආකාරයෙන් හැසිරීම අපේක්ෂා කෙරේ. ශිෂ්‍ය චර්යාධර්ම සංග්‍රහය මඟින් විශ්වවිද්‍යාලය ඇතුලත ස්ථානීය හැසිරීම් අපේක්ෂාවන් දක්වා ඇත. සියලුම සිසුන් මෙම ආචාර ධර්ම පද්ධතිය පිළිබඳ මනා අවබෝධයකින් යුතු වීම අත්‍යවශ්‍ය වේ. මේ අනුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය විනය ක්‍රියා පටිපාටිය යටතේ, ශිෂ්‍ය චර්යාධර්ම සංග්‍රහයේ කිසියම් හෝ උල්ලංඝනයක්, විනය කාරණයක් ලෙස සැලකිය හැකිය.

**1. ශිෂ්‍ය අනන්‍යතාව**

1.1. ශිෂ්‍යයා සතුව විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත සහ ශිෂ්‍ය වාර්තා පොත තිබිය යුතුය. එකී හැඳුනුම්පතෙහි සහ ශිෂ්‍ය වාර්තා පොතෙහි ශිෂ්‍යයාගේ ඡායාරූපය අඩංගු විය යුතු අතර විශ්වවිද්‍යාලයේ මුද්‍රාවෙන් එය සම්මත (emboss) කර තිබිය යුතුය. මෙම ලේඛන ශිෂ්‍යයාගේ අනන්‍යතාව සහ සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාව පිළිබඳ තීරණාත්මක සාක්ෂි ලෙස ක්‍රියා කරනු ඇත.

1.2. විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි සෑම ශිෂ්‍යයෙකුම සෑම විටම තම හැඳුනුම්පත සහ/හෝ ශිෂ්‍ය වාර්තා පොත තමන් සන්තකයේ තබා ගත යුතුය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු, පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු, ආරක්ෂක නිලධාරියෙකු විසින් හෝ, මහෝපාධ්‍යායයන් වහන්සේ (උපකුලපතිවරයා) හෝ ලේඛකාධිකාරිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටින විට ඔවුන්ට එය ඉදිරිපත් කිරීමට හැකි විය යුතුය.

1.3. විශ්වවිද්‍යාලයේ බලයලත් නිලධාරියෙකු ඉල්ලා සිටින විට, එසේ ලියාපදිංචි ශිෂ්‍යයෙකු තම හැඳුනුම්පත හෝ ශිෂ්‍ය වාර්තා පොත හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, හෝ හිතාමතාම ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ ඉදිරිපත් කිරීම නොසලකා හැරියහොත්, එම ශිෂ්‍යයා මෙම මාර්ගෝපදේශ යටතේ දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු ලෙස සලකනු ලැබේ.

1.4. යම් ශිෂ්‍යයෙකු තම හැඳුනුම්පත හෝ ශිෂ්‍ය වාර්තා පොත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්, එම නිලධාරියාට ඒ බව විශ්වවිද්‍යාලයේ විනයාධිකාරී/විනයපාලක (Proctor) හෝ ලේඛකාධිකාරී (Registrar) වෙත වාර්තා කළ හැකිය. අදාළ ශිෂ්‍යයා ශිෂ්‍ය නේවාසිකාගාරයක පදිංචිව සිටින්නේ නම්, එම නිලධාරියා විසින් ඒ බව උපශාලාධිපතිට ද දැනුම් දිය යුතුය. ශිෂ්‍යයා නේවාසිකව පදිංචිව නොසිටින්නේ නම්, ඔහු/ඇය විනයාරක්ෂක (Marshal) හෝ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වෙත ඉදිරිපත් කළ හැකි අතර, පසුව ඔහු/ඔවුන් විසින් නිසි ක්‍රියාමාර්ග සඳහා විනයාධිකාරී හෝ විනයපාලක වෙත වාර්තා කරනු ඇත.

## 2. ශිෂ්‍ය පෙනුම

2.1 ප්‍රසිද්ධියේ පෙනී සිටින අවස්ථාවන්හිදී භික්ෂු ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය විසින් නියම කර ඇති පරිදි සුදුසු වර්ණයෙන් (දුඹුරු/ කහ /තැඹිලි/මෙරූන්) යුතු සිවුරු දැරිය යුතුය. ඔවුන් සෑම මසකම 30 හෝ 31 වන දිනට පෙර හෝ පුර පසළොස්වක පොහොය දිනට පෙර තමන්ගේ හිසකෙස්, රැවුල සහ උඩු රැවුල ඇතුළුව, කපා පිරිසිදු කර ගත යුතුය.

2.2 ගිහි සිසුන්, අධ්‍යයන පරිසරයට සුදුසු යැයි සැලකෙන ඇඳුම්වලින් සැරසී සිටිය යුතුය. විශ්වවිද්‍යාලයේ සිටින කාලය තුළ ශිෂ්‍යයා හඳුනා ගැනීමට එකී ඇඳුම/ඇඳුම් බාධාවක් නොවිය යුතුය.

## 3. ශිෂ්‍ය නවක වදය

3.1 නවක වදයකට සෘජුව හෝ වක්‍ර මොන යම් ආකාරයකින් සම්බන්ධ වන ඕනෑම ශිෂ්‍යයෙකු නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගේ ක්‍රියාමාර්ගවලට මුහුණ දීමට අමතරව, විශ්වවිද්‍යාලයෙන් නෙරපා හැරීමට කටයුතු කරනු ලැබේ.

*පහත සඳහන් ක්‍රියාකාරකම් නවක වදයට අදාල ලෙස සැලකේ;*

අ) නවකයෙකු හෝ වෙනත් ඕනෑම ශිෂ්‍යයෙකු වාචික හෝ ලිඛිත හැසිරීමක් තුළින් සමච්චලයට පත් කිරීම, අනිසි ලෙස සැලකීම හෝ රළු ලෙස හැසිරවීමේ බලපෑමක් ඇති කළ හැකි ඕනෑම ශිෂ්‍යයෙකුගේ ක්‍රියාවක්.

ආ) එනම් ඕනෑම නවක හෝ වෙනත් ශිෂ්‍යයෙකු හට කරදර, දුෂ්කරතා, ශාරීරික හෝ මානසික හානියක් ඇති කිරීමට හෝ බිය හෝ සැකය ඇති කිරීමට තුඩු දිය හැකි, ඕනෑම ශිෂ්‍යයෙකුගේ හෝ ශිෂ්‍යයන්ගේ බාධාකාරී හෝ අක්‍රමික හැසිරීම.

ඇ) නවක හෝ වෙනත් ඕනෑම ශිෂ්‍යයෙකු සාමාන්‍යයෙන් නොකරන, ලැජ්ජාවට, වධහිංසාවට හෝ අපහසුතාවයට පත්වීම තුලින් ශරීරයට හෝ මනසට හානි විය හැකි දෙයක් කිරීමට නවක හෝ වෙනත් ඕනෑම ශිෂ්‍යයෙකුගෙන් ඉල්ලා සිටීම.

ඈ) නවක හෝ වෙනත් ශිෂ්‍යයෙකුගේ නිත්‍ය අධ්‍යයන කටයුතුවලට බාධා කළ හැකි, අවහිර කළ හැකි හෝ වළක්වාලිය හැකි, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෙකු විසින් කරන ඕනෑම ක්‍රියාවක්.

ඉ) කිසියම් පුද්ගලයෙකුට හෝ ශිෂ්‍ය කණ්ඩායමකට පවරා ඇති අධ්‍යයන කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා නවක හෝ වෙනත් ඕනෑම ශිෂ්‍යයෙකුගේ සේවාවන් බලහත්කාරයෙන් ලබා ගැනීම.

ඊ) වෙනත් සිසුන් විසින් නවක සිසුවෙකුගෙන් මූල්‍යමය කප්පම් ගැනීමක් හෝ බලහත්කාර මූල්‍යමය බරක් පැටවීමේ ඕනෑම ක්‍රියාවක්.

උ) ශාරීරික හානියක් හෝ පුද්ගල සෞඛ්‍යයට හෝ පුද්ගලයාට වෙනත් කිසියම් අනතුරක් වීමට තුඩුදෙන; ලිංගික අපයෝජනය, සමලිංගික හිංසනය, ඇඳුම් ගලවා දැමීම, අසභ්‍ය අභිනයන් බලහත්කාරයෙන් සිදු කිරීම ඇතුළුව ඕනෑම ශාරීරික අපයෝජන ක්‍රියාවක්.

ඌ) නවක හෝ වෙනත් ඕනෑම සිසුවෙකුට අපහසුතාවක් ඇති කිරීමෙන් විකෘති සතුටක් ලබා ගැනීම උදෙසා; කථන වචන, ඊමේල්, පළකිරීම් හෝ ප්‍රසිද්ධ අපහාස ඇතුළුව, ඒ හරහා සිදුවන ඕනෑම අපයෝජන ක්‍රියාවක්.

එ) දුක්ඛිත සතුටක් ලබා ගැනීමේ හෝ බලය, අධිකාරිය හෝ උසස් බව පෙන්වීමේ හුදු චේතනාවක් ඇතිව හෝ නැතිව, නවක හෝ වෙනත් ඕනෑම සිසුවෙකුගේ මානසික යහපැවැත්මට සහ ආත්ම අභිමානයට බලපෑමක් ඇති කරන ඕනෑම ක්‍රියාවක්.

## 4. ශිෂ්‍ය නේවාසිකාගාරය තුල හැසිරීම

4.1 සෑම ශිෂ්‍යයෙක්ම නේවාසිකාගාරයට ඇතුළුවීමත් සමඟම, එම ශිෂ්‍යයා විශ්වවිද්‍යාලයේ නේවාසික සිසුන්ට ඇතුළත් වන අවස්ථාවේදී අදාළ වන නීතිරීතිවලට මෙන්ම, අනාගතයේදී හඳුන්වා දිය හැකි ඕනෑම රෙගුලාසියකට/රෙගුලාසිවලට අනුකූල වීමට එකඟ වූ බව සලකනු ලැබේ.

විශ්වවිද්‍යාල සිසුන්ට සාමාන්‍යයෙන් අදාළ වන සියලුම නීති නේවාසිකාගාර සිසුන්ට ද අදාළ වේ. මෙහි සියලුම සිසුන් නේවාසිකාගාරයේ/නේවාසික නිවසේ අන් අයට බාධා කිරීමෙන් වැළකී සිටිය යුතු අතර ඔවුන් පදිංචි නේවාසිකාගාරය සඳහා සෑම විටම හොඳ නමක් පවත්වා ගත යුතුය. නේවාසිකාගාර ශාලාධිපති/උපශාලාධිපති විසින් එවැනි කිසියම් හෝ නීති උල්ලංඝනය කිරීමක් වේ නම්, එය මහෝපාධ්‍යායයන් වහන්සේට වාර්තා කළ යුතුය.

4.2 සෑම සිසුවෙකුම, තනි තනිව සහ සාමූහිකව නේවාසිකාගාරයේ තමන්ගේ භාවිතය සඳහා සපයා ඇති පහසුකම් සහ පොදු භාවිතයේ ඇති අනෙකුත් සියලුම අයිතම ආරක්ෂා කිරීම සඳහා බැඳී සිටී. සිසුන් විසින් කිසිදු ස්ථාපිතයකට (installation) හෝ උපකරණයකට හානි කිරීම හෝ වෙනස් කිරීම නොකළ යුතු අතර, අවසර දී ඇති දේවලට අමතරව වෙනත් කිසිදු අරමුණක් සඳහා සිසුන් එවැනි ස්ථාපිතයන් හෝ උපකරණ භාවිතා නොකළ යුතුය.

4.3 ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍ය කණ්ඩායමක් විසින් සිදු කරන ලද ඕනෑම හානියක් සඳහා වන පිරිවැය සම්පූර්ණ විමර්ශනයකින් පසු, වගකිවයුතු ශිෂ්‍යයාගෙන් හෝ කණ්ඩායමෙන් අයකර ගනු ලැබේ.

4.4 නේවාසිකාගාර/විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ දුම්පානය, දුම්කොළ නිෂ්පාදන භාවිතය සහ කෙළ ගැසීම, සහ මත්පැන් හෝ අනෙකුත් මත්ද්‍රව්‍ය පරිශීලනය සපුරා තහනම් වේ. විශ්වවිද්‍යාල

පරිශ්‍රය දුම්පානයෙන් හා මධ්‍යසාරයෙන් තොර කලාපයක් බැවින් මෙම රීතිය උල්ලංඝනය කිරීම විනය ක්‍රියාමාර්ග ගැනීමට හේතු වේ.

4.5 පෝස්ටර් ලිවීම සහ ඇලවීම, හුණුවලින් බිත්ති සැරසීම (wall-chalking), සටන් පාඨ භාවිතය යනාදී කිසිදු ආකාරයකින් නේවාසිකාගාරය අපවිත්‍ර කිරීමට අවසර නැත.

4.6 නේවාසිකාගාර සිසුන්ට නේවාසික නොවන තම මිතුරන් නේවාසිකාගාරයේ රඳවා තබා ගැනීමට අවසර නැත.

4.7 විනය ක්‍රියාමාර්ගයක් හේතුවෙන් ශිෂ්‍යයෙකුගේ නේවාසිකාගාර පහසුකම් අත්හිටුවුවහොත් හෝ අවසන් කළහොත්, ශිෂ්‍යයා දැනටමත් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවීමකට හෝ අනාගතයේදී ගෙවිය යුතු ගාස්තු අඩු කිරීමකට හිමිකම් නොලැබේ.

4.8 අමුත්තන් සඳහා අවසර ලබාදී ඇති සාමාන්‍ය වේලාවෙන් පිටත අමුත්තන් පිළිගන්නා සිසුන්, එම අමුත්තන්, ලියාපදිංචි සිසුන් හෝ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය නොවේ නම්, නේවාසිකාගාරයේ උපශාලාධිපති වෙත වාර්තා කර ඒ සඳහා අවසර ලබා ගත යුතුය.

4.9 විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ නේවාසිකාගාරයක පදිංචිව සිටින සියලුම සිසුන් පැය 22:00 න් පසුව පිටතට නොයා යුතුය.

4.10 පැය 22:00 න් පසු පීඨයට හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රයට ඇතුළු වීමට අවශ්‍ය කරන සිසුන් ආරක්ෂක කාර්ය මණ්ඩලයට තම විශ්වවිද්‍යාල හැඳුනුම්පත්/වාර්තා පොත් ඉදිරිපත් කළ යුතු අතර, ඔවුන් විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රමාද වී පැමිණීමේ ලොග් පොතෙහි අත්සන් කළ යුතුය. ඔවුන් තම ඇතුලත්වීමේ අංකය, නම, ප්‍රමාද වීමට හේතුව සහ අත්සන ලබා දිය යුතුය.

විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පැය 22:00 න් පසු නිශ්චිත කාලයක් සඳහා විශේෂිත වූ ක්‍රියාකාරකමක යෙදීම සඳහා විශ්වවිද්‍යාල විනයපාලකවරයාගේ නිර්දේශය ඇතිව ශිෂ්‍යයා/ශිෂ්‍යයන් විසින් මහෝපාධ්‍යායයන් වහන්සේගෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

හදිසි අවස්ථාවකදී, නේවාසිකාගාරවලට ඇතුළුවීමේ සහ පිටවීමේ වේලාවන් වෙනස් කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේට බලය ඇත.

4.11 හදිසි අවස්ථාවකදී, මහෝපාධ්‍යායයන් වහන්සේගේ නියෝගය මත නිලධාරීන්ට නේවාසිකාගාර පරීක්ෂා කිරීමට අවසර ඇත.

4.12 බෝවන රෝගයකට ගොදුරු වන ඕනෑම ශිෂ්‍යයෙකු, ඒ පිළිබඳව වහාම සුදුසුකම්ලත් වෛද්‍ය නිලධාරියෙකුගෙන් උපදෙස් ලබා ගත යුතු අතර හැකි ඉක්මනින් නේවාසිකාගාර පාලක වෙත වාර්තා කළ යුතුය.

## 5. ශිෂ්‍ය සංවිධානය

5.1 විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංවිධානයක් 2012 අංක 15 දරන පනතින් සංශෝධනය කරන ලද 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ සඳහන් නීතිරීතිවලට සහ ඊට අනුරූප අතුරු ව්‍යවස්ථාවලට අනුකූල විය යුතුය. ඉහත කී පනතෙහි (1996 අංක 26) සහ එකී සංශෝධනයෙහි (2012 අංක 15) නියමයන්ට අනුව විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි නොවන ලද කිසිදු වෘත්තීය සමිතියකට හෝ ශිෂ්‍ය සංගමයකට විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක විය නොහැක.

විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංවිධාන, ඒවායේ සමාජයීය/ ශිෂ්‍ය හා අනෙකුත් ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ නීතිරීති පිළිපැදිය යුතුය.

5.2 සියලුම ශිෂ්‍ය සංවිධාන විශ්වවිද්‍යාල ප්‍රජාවේ වටිනාකම්වලට අනුගතව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශිෂ්‍ය සංවිධානයක සාමාජිකයින් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපත්තිය උල්ලංඝනය කරන ඕනෑම ක්‍රියාවකදී අදාළ ශිෂ්‍ය සංවිධානය සාමූහිකව වගකිව යුතුය.

5.3 ශිෂ්‍ය සංවිධානය සමස්ත ශිෂ්‍ය ප්‍රජාවම නියෝජනය කරන අතර ශිෂ්‍ය ප්‍රජාවේ කැමැත්ත ඇතිව පහත සඳහන් නිලධාරී මණ්ඩලය තේරී පත් වේ: (අ) සභාපති, (ආ) උපසභාපති, (ඇ) ලේකම්, (ඇ) කර්තෘ සහ (ඉ) කනිෂ්ඨ භාණ්ඩාගාරික. ශිෂ්‍ය සංවිධානයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයා, මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් වනු ඇත.

5.4 ශිෂ්‍ය සංවිධානය, ශිෂ්‍ය ප්‍රජාව තුළ ඔවුන්ගේ ආයතනික ජීවිතය වැඩිදියුණු කිරීම සඳහා සිසු- කුසලතා, සිසු-දක්ෂතා, ආකල්ප සහ සමගිය ප්‍රවර්ධනය කළ යුතුය.

5.5 සමාජ, සංස්කෘතික සහ සුභසාධන කටයුතු සඳහා මූල්‍යමය දායකත්වය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින්, මහෝපාධ්‍යායයන් වහන්සේගේ අනුමැතිය ඇතිව අරමුදල් රැස් කිරීමට ශිෂ්‍ය සංවිධානයට අවසර ඇත. අරමුදල් වෙන් කිරීම සහ මූල්‍ය වාර්තා පවත්වාගෙන යාමේ ක්‍රම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් ස්ථාපිත කර ඇති මූල්‍ය රෙගුලාසිවලට ශිෂ්‍ය සංවිධානය අනුකූල විය යුතු යැයි අපේක්ෂා කෙරේ.

## 6. රැස්වීම්

6.1 ස්ථාපිත ක්‍රියාපටිපාටියට අනුකූලව, මහෝපාධ්‍යායයන් වහන්සේගේ පූර්ව අවසරයකින් තොරව, මහජනතාවට විවෘත කිසිදු රැස්වීමක් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පැවැත්විය නොහැක.

6.2 රැස්වීමට අනුමැතිය ලබා දීමෙන් පසු එය පැවැත්වෙන ස්ථානය සහ වේලාව තීරණය කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේට බලය ඇත. මහෝපාධ්‍යායයන් වහන්සේගේ පූර්ව අවසරයකින් තොරව, මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නිර්දේශ කරන ලද රැස්වීමේ ස්ථානය හෝ වේලාව වෙනස් නොකල යුතුය.

මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වීම දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස සැලකේ. මේ සම්බන්ධයෙන් අවසරය සඳහා අයදුම්පත ඉදිරිපත් කළ නම/නම් සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යයින් වගකිව යුතු වන අතර දඬුවම් ලැබීමට යටත් වේ.

6.3 මහෝපාධ්‍යායයන් වහන්සේගේ පූර්ව අවසරයකින් තොරව සිසුන්, වෙනත් ආයතනවල මිතුරන්ට හෝ වෙනත් බාහිර පුද්ගලයින්ට කිසිදු රැස්වීමක් සඳහා විශ්වවිද්‍යාලයට ආරාධනා නොකළ යුතුය.

6.4 අනවසර රැස්වීමක් කැඳවීම විනය විරෝධී ක්‍රියාවක් ලෙස සලකනු ලබන අතර එය විනය ක්‍රියාමාර්ග ගැනීමට හේතු විය හැක.

## 7. පන්ති කාමර තුළ චර්යාධර්ම සංග්‍රහය

7.1 පන්ති, නිබන්ධන, පරීක්ෂණ සහ විභාගවලදී සිසුන් නිසි වෙලාවට වැඩ කිරීම සහ නිතිපතා සහභාගී වීම අවශ්‍ය වේ. පැමිණීමේ අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීම, පැවරුම් ඉදිරිපත් නොකිරීම සහ පරීක්ෂණ/විභාගවලට අහේතුක ලෙස නොපැමිණීම ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබේ.

7.2 සෑම දේශන සැසියක ආරම්භයේදී ම සිසුන් තම පන්ති කාමරවල අසුන් ගෙන සිටිය යුතු අතර, කථිකාචාර්යවරයාගේ අවසරයකින් තොරව පන්ති කාමරයට ඇතුළු වීම හෝ පිටවීම නොකළ යුතුය.

7.3 අවසරය මත මිස පන්ති වේලාවන් තුළ ජංගම දුරකථන භාවිතය තහනම් කර ඇති අතර එම භාවිතය දඬුවම් ලැබිය හැකි වරදකි.

7.4 දැන්වීම් නොසලකා හැරීම කිසිදු නිදහසට කරුණක් ලෙස සලකනු නොලබන බැවින්, සිසුන් දැන්වීම් පුවරුවේ පළ කර ඇති දැන්වීම් සහ මාර්ගගත හා අනෙකුත් විද්‍යුත් දැන්වීම් ඉතා සුපරීක්ෂාවෙන් හා උනන්දුවෙන් පිළිපැදිය යුතුය.

7.5 කථිකාචාර්යවරයෙකුගේ නොපැමිණීමකදී හෝ පන්තියක් පැවැත්වීමට නොහැකි වීමකදී, සිසුන් යාබද පන්තිවලට බාධාවක් නොවන සේ හැසිරීමට වග බලා ගත යුතුය.

7.6 සිසුන් විසින් විශ්වවිද්‍යාලය තුළ දී සහ ඉන් පිටත දී අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට මෙන්ම සෙසු සිසුන්ට ද ආචාරශීලී විය යුතු යැයි අපේක්ෂා කෙරේ. ආයතනයේ කීර්ති නාමයට හානි විය හැකි කිසිදු ක්‍රියාවක හෝ හැසිරීමක ඔවුන් නිරත නොවිය යුතුය.

7.7 පන්ති පවත්නා වේලාවන්හිදී, සිසුන්ට විශ්වවිද්‍යාලයේ කොරිඩෝවල ඔබ මොබ ඇවිදීමට හෝ සිටගෙන සිටීමට අවසර නැත.

7.8 සිසුන් ඉගෙනීමේ අත්දැකීමෙන් අවධානය වෙනතකට යොමු කරන හැසිරීම්වල නිරත නොවිය යුතුය. පන්තියේ කතාබස් කිරීම, නිදා ගැනීම, පුවත්පත් කියවීම හෝ වෙනත් බාහිර වැඩෙහි යෙදීම, පන්ති කාමරය තුළට සහ පිටතට අනවශ්‍ය සහ අනවසර ලෙස ගමන් කිරීම, යනාදිය ඊට ඇතුළත් වේ.

7.9 පන්ති කාමරය, අදහස් නිදහසේ සාකච්ඡාවට බඳුන්වන ස්ථානයක් විය යුතු අතර, සිසුන් සියලු පුද්ගලයින්ට ගරු කරමින් හැසිරීම සහ ප්‍රකාශනය කළ යුතුය.

7.10 ප්‍රමාණවත් නිදහසට කරුණු සපයා ඇති අවස්ථාවකදී හැර, සිසුන් නියමිත වේලාවට සියලුම පරීක්ෂණවලට පෙනී සිටිය යුතු අතර, නියමිත වේලාවට පන්තියේ සියලුම ගෙදර වැඩ (Home Wrok) පැවරුම් භාර දිය යුතුය.

7.11 වංචා කිරීම, ප්‍රබන්ධ කිරීම, කොපි කිරීම, කුමන්ත්‍රණය කිරීම, අධ්‍යයන වංකභාවයට පහසුකම් සැලසීම, අන් අයගේ කෘතිවලට කර්තෘත්වය ප්‍රකාශ කිරීම හෝ කෘත්‍රිම බුද්ධි පරිවර්තන වැඩසටහනක් හරහා ජනනය කරන ලද අභ්‍යාස හිමිකාරත්ව පිළිගැනීමකින් හෝ අවසරයකින් තොරව තක්සේරුව සඳහා ඉදිරිපත් කිරීම තහනම් වේ.

7.12 තොරතුරු සහ දත්ත සකස් කිරීම හෝ අසත්‍යකරණය කිරීම, වැරදි ලෙස නිරූපණය කරන ලද දත්ත සහ/හෝ රූපිකත්වයන් හෝ මැදිහත්වීම්, තොරතුරු කොපි කිරීම සහ පිළිගත් ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමට හෝ පර්යේෂණ සිදු කිරීමේදී නිසි සැලකිල්ලක් දැක්වීමට අපොහොසත් වීම තහනම් වේ.

**8. අරමුදල් එකතු කිරීම**

8.1 මහෝපාධ්‍යායයන් වහන්සේගේ පූර්ව අවසරයකින් තොරව, කිසිදු ශිෂ්‍ය සංවිධානයකට එහි විධානයන්ට අනුකූල නොවන අරමුණු සඳහා සිසුන්ගෙන් අරමුදල් රැස් කළ නොහැක.

8.2 අරමුදල් රැස් කිරීමට බලයලත් ඕනෑම ශිෂ්‍ය සංවිධානයක්, එම මුදල් එකතු කළ දින සිට සති දෙකක් ඇතුළත ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික වෙත ගිණුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර, එම අරමුදල් වහාම බලයලත් ගිණුමක තැන්පත් කළ යුතුය.

8.3 මෙම අවශ්‍යතාවට අනුකූල වීමට අපොහොසත් වීම දඩුවම් ලැබිය හැකි වරදක් ලෙස සැලකේ. එවැනි අවස්ථාවකදී මේ සම්බන්ධයෙන්, අවසරය සඳහා අයදුම්පත ඉල්ලා සිටි නම/නම් සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යයින් වගකිව යුතු වන අතර දඩුවම් ලැබීමට පාත්‍ර වේ.

8.4 බාහිර මූලාශ්‍රවලින් අරමුදල් රැස් කිරීමේදී ඕනෑම ශිෂ්‍යයෙකු හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංවිධානයක්, ඒ සඳහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් සුදුසු යැයි නිගමනය කරන ක්‍රමවේදයක් අනුගමනය කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවසරය ලබා ගත යුතුය.

**9. පෝස්ටර්, පුවත්පත් සහ අත්පත්‍රිකා**

9.1 මහෝපාධ්‍යායයන් වහන්සේගේ ප්‍රකාශිත අවසරයකින් තොරව විශ්වවිද්‍යාලය තුළ කිසිදු දැන්වීමක්, පෝස්ටරයක් හෝ ප්‍රකාශනයක් ප්‍රසිද්ධ කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට කිසිදු ශිෂ්‍යයෙකුට, ශිෂ්‍ය සමූහයකට, ශිෂ්‍ය සංගමයකට හෝ වෙනත් කිසිදු සංවිධානයකට අවසර නැත. අවසරය ලබා දී ඇති අවස්ථාවන්හිදී ද, එවැනි දැන්වීම් ප්‍රදර්ශනය කිරීම විශ්වවිද්‍යාල පරිශ්‍රයේ නම් කරන ලද ප්‍රදේශවලට පමණක් සීමා කළ යුතුය.

වගකිව යුතු සංවිධානයේ නමට අමතරව, ඒ හා සමඟම; පෝස්ටරය, දැන්වීම හෝ ප්‍රකාශනයේ ප්‍රකාශිත දිනය පැහැදිලිව ඉදිරිපත් කළ යුතුය.

9.2 මහෝපාධ්‍යායයන් වහන්සේගේ පූර්ව අවසරයකින් තොරව පීඨ පරිශ්‍රය තුළ පුවත්පත්, වාර සඟරා හෝ අත්පත්‍රිකා විකිණීම හෝ බෙදා හැරීම සපුරා තහනම්ය.

**10. සන්නිවේදනය**

10.1 විශ්වවිද්‍යාලයේ නිල ක්‍රියාකාරකම්වලට අදාළ කරුණු සම්බන්ධයෙන් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යයන් හෝ ශිෂ්‍ය සංවිධානයක් විසින් මහාමහෝපාධ්‍යායයන් වහන්සේට, විශ්වවිද්‍යාල පාලක සභාවේ ඕනෑම සාමාජිකයෙකුට හෝ රේඛීය අමාත්‍යාංශයේ ඕනෑම නිලධාරියෙකුට හෝ ඕනෑම බාහිර ආයතනයකට ආරම්භ කරන හෝ ඔවුන්ගෙන් ලබා ගන්නා සියලුම සන්නිවේදනයන්, මහෝපාධ්‍යායයන් වහන්සේ හරහා පමණක් සිදු කිරීම අවශ්‍ය වේ.

10.2 කිසියම් කරුණක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය අවමානයට ලක් කළ හැකි කිසිදු සන්නිවේදනයක් කිසිදු බාහිර ආයතනයකට, මාධ්‍ය ආයතනයකට හෝ විද්‍යුත් මාධ්‍යයකට, කිසියම් ශිෂ්‍යයෙකු, ශිෂ්‍ය සංවිධානයක් හෝ වෙනත් සංගම් විසින් සම්ප්‍රේෂණය නොකළ යුතුය.

## 11. විනය ක්‍රියාමාර්ගවලට යටත් වන අනෙකුත් වැරදි

11.1 විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පුද්ගලයන්ට හෝ දේපළවලට තුවාල සිදු කළ හැකි හෝ තර්ජනයක් එල්ල කළ හැකි ඕනෑම ක්‍රියාකාරකමක් සඳහා ආයුධ, මත්ද්‍රව්‍ය සහ/හෝ වෙනත් ඕනෑම හානිකර ද්‍රව්‍යයක්; සන්තකයේ තබා ගැනීම, ගබඩා කිරීම, රැගෙන යාම හෝ භාවිතා කිරීම සපුරා තහනම් වේ.

11.2 විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉන් පිටත හෝ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද උත්සවවලදී හෝ මෙහි විස්තර කර ඇති ඕනෑම ක්‍රියාකාරකමක්; පැහැර ගැනීම, පැහැර ගැනීමට උත්සාහ කිරීම, ප්‍රාණ ඇපයට ගැනීම හෝ ඕනෑම ශිෂ්‍යයෙකු, නිලධාරියෙකු, අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු, වෙනත් සේවකයෙකු හෝ ඕනෑම බලයලත් පුද්ගලයෙකු ප්‍රාණ ඇපයට ගැනීමට හෝ පැහැර ගැනීමට තර්ජනය කිරීම සපුරා තහනම් වේ.

11.3 විශ්වවිද්‍යාලය තුළ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය, ඉගැන්වීම, අධ්‍යයනය, පර්යේෂණ හෝ විභාග කඩාකප්පල් කිරීමට ඉඩ ඇති ක්‍රියාකාරකම්වල යෙදීම හෝ විශ්වවිද්‍යාලය හෝ එහි පීඨ විසින් පරිශ්‍රය තුළ හෝ ඉන් පිටත සංවිධානය කරනු ලබන ඕනෑම නිල උත්සවයකට බාධා කිරීම හෝ කඩා කප්පල් කිරීම තහනම් වේ.

11.4 කිසියම් ශිෂ්‍යයෙකුගේ/ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතු හෝ පර්යේෂණ පවත්වාගෙන යෑම තහනම් කිරීම හෝ බාධා කිරීම, විශ්වවිද්‍යාලය පිළිගත් ශිෂ්‍ය සංවිධානයක හෝ සංගමයක නීත්‍යානුකූල ක්‍රියාකාරකම් කඩාකප්පල් කිරීම තහනම් වේ.

11.5 විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ඕනෑම ශිෂ්‍යයෙකුගේ හෝ සේවකයෙකුගේ සංචලනයට ඇති අයිතියට අවහිර කිරීම, බාධා කිරීම හෝ උල්ලංඝනය කිරීම තහනම් වේ.

11.6 විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ඕනෑම ශිෂ්‍යයෙකුගේ හෝ සේවකයෙකුගේ සංචලනයට ඇති අයිතියට බාධා කරන හෝ එය උල්ලංඝනය කරන ආකාරයෙන් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ වාහනයක් ක්‍රියාත්මක කිරීම, පැදවීම හෝ ගාල් කිරීම හෝ එවැනි ක්‍රියාකාරකමකට සහාය වීම තහනම් වේ.

11.7 විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ දේපළ සොරකම් කිරීම හෝ සොරකම් කිරීමට උත්සාහ කිරීම, විශ්වවිද්‍යාලයට අයත් සොරකම් කළ දේපළ සන්තකයේ තබා ගැනීම, පීඨ දේපළවලට හෝ නිලධාරියෙකුගේ; අධ්‍යයන හෝ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුගේ, වෙනත් ඕනෑම සේවකයෙකුගේ හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුගේ/ශිෂ්‍යයන්ගේ හෝ, විශ්වවිද්‍යාල පරිශ්‍රයේ හෝ ඉන් පිටත විශ්වවිද්‍යාලයේ අධිකාරිය ඇතිව සංවිධානය කරන ලද උත්සවයක සිටීමට බලයලත් වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ දේපළවලට හිතාමතා හානි කිරීම සපුරා තහනම් වේ.

11.8 පීඨ පරිශ්‍රය තුළ හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉන් පිටත නිල උත්සවයකදී, පීඨ සාමාජිකයෙකුට, කාර්ය මණ්ඩලයකට හෝ ශිෂ්‍යයෙකුට අයත් ඕනෑම දේපළක් විකෘති කිරීම හෝ හානි කිරීම සපුරා තහනම් වේ.

11.9 විශ්වවිද්‍යාලය විසින් ස්ථාපිත කර ඇති නීතිරීති සහ විධිවිධානවලට අනුකූලව හෝ මහෝපාධ්‍යායයන් වහන්සේගේ/පීඨාධිපතිවරයාගේ හෝ අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයාගේ පැහැදිලි අවසරයක් නොමැතිව, විශ්වවිද්‍යාලයට අයත් කිසියම් දේපළක් අනවසරයෙන් අත්පත් කර ගැනීම, සන්තකයේ තබා ගැනීම, රඳවා තබා ගැනීම හෝ භාවිතා කිරීම සපුරා තහනම් වේ.

11.10 කිසියම් ශිෂ්‍යයෙකු විසින් විශ්වවිද්‍යාල පරිගණක පද්ධතිය/ජාලය අනවසරයෙන් හෝ අනිසි ලෙස භාවිතා කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස සලකනු ලැබේ.

-End-